# ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත ගෙන ඒමේ ඉතිහාසය

තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක් නොමැති සාර්ක් කලාපයේ එකම එට ශ්‍රී ලංකාවයි. නමුත් ශ්‍රී ලංකාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක අවශ්‍යතාවය සම්බන්ධ සාකච්ඡාව 1994 දක්වාම දිවයයි. විශේෂයෙන් 1994 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී පොදුපෙරමුණට සහය දැක්වූ මාධ්‍ය සංවිධාන හා සිවිල් සංවිධාන විසින් මැතිවරණ සටනේදී මතු කරන ලදී. මේ පිළිබඳව පළමු වරට ලිඛිත සටහනක් හමුවන්නේ 1994 වසරේ දී තොරතුරු සංචාරක හා ගුවන් සේවා අමාත්‍ය ධර්මසිරි සේනානායක මහතා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන "ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රතිපත්තිය" පිළිබඳ කැබිනට් පත්‍රිකාව මගිනි. 1994 වසරෙන් ශ්‍රී ලංකාවේ ඇරඹි තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ නීතිය සම්බණ්ධයෙන් සිදුවූ සාකච්ඡාවේ ගමන්මග පිළිබඳව සටහනකි.

**තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන-**

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුලත් වන්නේ 2015 වසරේදී සිදුකරන ලද 19 වන සංශෝධනය මගිනි[1]. නමුත් "ප්‍රකාශනය ඇතුළු අදහස් පළකිරීමේ නිදහස"[2] මූලික අයිතියක් ලෙස සහතික වී තිබිණි. තොරතුරු දැකගැනීමේ අයිතිය මූලික අයිතියක් ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කල යුතු බවට මුල් වරට ප්‍රතිපත්තිමය තීරණයක් ගනුලබන්නේ 1994 වසරේදීය. 1994 ඔක්තෝබර් 10 වන දින තොරතුරු,සංචාරක හා ගුවන්සේවා අමාත්‍ය ධර්මසිරි සේනානායක විසින් කැබිනට් පත්‍රිකාවක් මගින් පොදු පෙරමුණු ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.එහි අංක දෙක ලෙස සඳහන් වූයේ තොරතුරු දැනගැනීමේ අයිතිය පුලුල් ලෙස පිළිගන්නා බවත් තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාමය රැකවරණයක් ලබාදෙන බවත්ය[3]. පසුව ජනමාධ්‍ය අමාත්‍යංශය විසින් පත්කළ මාධ්‍ය නිදහස හා ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති ප්‍රතිසංස්කරණය සඳහා උපදෙස් ලබාදීමට පත්කරන ලද උපදේශක කමිටුව ( ආර්.කේ.ඩබ්.ගුණසේකර කමිටුව) සිය නිර්දේශය 1996 මැයි 27 වන දින ඉදිරිපත් කරන ලදී. එහි නිර්දේශ අංක 3 ලෙස සඳහන් වූයේ පවතින ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සඳහන් ආකාරයට අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට තොරතුරු දැනගැනීමේ අයිතියද ඇතුලත් කළ යුතු බවයි [4].

නමුත් මෙම ව්‍යවස්ථා සංශෝධනය සිදු නොවී පවතින වාතාවරණයක් තුළ ප්‍රකාශනයේ අයිතිය තුළට තොරතුරු දැනගැනීමේ අයිතිය යන්න ඇතුලත් වන බවට විමල් ප්‍රනාන්දු එදිරිව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා තවත් අය( S. C. APPLICATION NO. 81/95.)[5] නැමති නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සීමාසහිත පරිසර යුක්ති

---

[1] 14අ 1 ව්‍යස්ථාව-ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
[2] 14.(1)(අ) ව්‍යවස්ථාව- ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
[3] Appendix A- Report of the Committee To Advice on the Reform of Laws Affecting Media Freedom and Freedom of Expression-1996
[4] Page55- Report of the Committee To Advice on the Reform of Laws Affecting Media Freedom and Freedom of Expression-1996
[5] පිටුව 157 ශ්‍රී ලංකා නීතිවාර්තා (1996)1

කේන්ද්‍රය එදිරිව නාගරික සංවර්ධන අධිකාරිය හා වෙනත් අය නැමති (SCFR 47/2004.)නඩුවේදීද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යළි සනාත කරන ලදී [6].

මාධ්‍ය නිදහස සහ සමාජ වගකීම් පිළිබඳව 1998 අප්‍රේල් 27 සිට 29 දක්වා කොළඹ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති ජනමාධ්‍ය සමුලුවේදී සම්මත කරගන්නා ලද "මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ වූ කොළඹ ප්‍රකාශනය" මගින්ද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධ ප්‍රතිපාදන නොමැති වීම සම්බන්ධයෙන් අවධාරණය කල අතර,සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (ICCPR) හි 19 වන ව්‍යවස්ථාවට අනුකූල වන ලෙස ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය විය යුතු බව දක්වන ලදී.

ජනවාර්ගික අර්බුධයට දේශපාලන විසදුමක් ගෙනඒමේ අරමුණින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රසංස්කරණ මේ වන විට ආරම්භව තිබූ අතර "පැකේජය" නමින් ප්‍රකට වූ දේශපාලන යෝජනාවලිය මත සකස් කරන ලද වර්ෂ 2000 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතේ මූලික අයිතිවාසිකම් යටතට තොරතුරු දැනගැනීමේ අයිතියද ඇතුලත් කර තිබිණි[7] . එහෙත් එකී ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගෙන ආ නමුත් විපක්ෂයෙන් මතුවූ දැඩි විරෝධය හේතුවෙන් සාකච්ඡා නොකරම බැහැරකරන ලදී.

**ආර්.කේ.ඩබ්.ගුණසේකර කමිටු වාර්තාව-1995**

1995 වසරේදී මාධ්‍ය නිදහස හා ප්‍රකාශනයේ නිදහසට බලපාන නීති ප්‍රතිසංස්කරණය සඳහා උපදෙස් ලබාදීමට ජනමාධ්‍ය හා සංචාරක අමාත්‍ය තුමන් විසින් පත්කරන ලද උපදේශක කමිටුවේ සභාපති නීතිඥ ආර්.කේ.ඩබ්.ගුණසේකර මහතා ඇතුළු කමිටුව විසින් තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳව පනතක් ගෙන ඒම සුදුසු බවට යෝජනා කරන ලදී(නිර්දේශ අංක 26). එම කමිටුවේ අනෙකුත් සමාජිකයින් වූයේ ආචාර්ය ශිරාණි බණ්ඩාරණායක, රොහාන් එදිරිසිංහ, වික්ටර් ගුණවර්ධන, ලූෂන් රාජකරුණානායක, ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, සූරියා වික්‍රමසිංහ යන අයවේ. එකී නිර්දේශය මගින් තවදුරටත් දක්වා සිටියේ විවෘත ආණ්ඩුක්‍රම මූලධර්ම හා පහත සඳහන් මූලධර්ම මත පදනම් විය යුතු බව සඳහන් විය.

- ව්‍යයතිරේඛයකට වඩා හෙලිදරව් කිරීම රීතියට බවට පත්විය යුතු බව
- තොරතුරු ප්‍රවේශයට සියලු දෙනාට සමාන අයිතියක් පැවතිය යුතුය
- තොරතුරු ඉල්ලා සිටින්නෙකු එකී තොරතුරු හෙලිදරව් කිරීමේ යුක්තිසහගත බව ඔප්පු කිරීම අවශ්‍ය නොවන අතර, යම් තොරතුරු ලබා නොදීම යුත්තිසහග බව ඔප්පුකිරීමේ වගකීම රජය මත පැවරේ.
- අයතු ලෙස තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීමකට එරෙහිව අධිකරණමය සහන ලැබීමේ හැකියාව[8]

මෙම මූලධර්ම වලට අමතරව තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනතේ ඇතුලත්විය යුතු කරුණු ගනනාවක්ම මෙම නිර්දේශවල ඇතුලත් විය.

---

[6] Supreme Court Minutes 23.11.2005
[7] 16 වන ව්‍යවස්ථාව 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත
[8] Page-61-Report of the Committee To Advice on the Reform of Laws Affecting Media Freedom and Freedom of Expression-1996

**ශ්‍රී ලංකා නීති කොමිසම ඉදිරිපත් කල කෙටුම්පත-1996**

1996 දී ශ්‍රී ලංකා නීති කොමිසම විසින් තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී. නීති කොමිසම මෙම කෙටුම්පත සමග ඉදිරිපත් කරන ලද වාර්තාව මගින් එවකට පැවති නීති තන්ත්‍රයේ අසතුටුදායක තත්වය පිළිබඳව ද පිළිගන්නා ලදී [9].

**කැබිනට් මණ්ඩලය සම්මත කල කෙටුම්පත-2004**

2002 හා 2003 වසර වලදී වසරේ දී කතෘ සංසදය, නිදහස් මාධ්‍ය ව්‍යාපාරය හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක්ව තොරතුරු ලබා ගැනීමේ නිදහස පිළිබඳව පනත් කෙටුම් පතක් ඉදිරිපත් කරන ලදී. එවකට සිටි අග්‍රාමාත්‍ය වරයා සමග සාකච්ඡා වාර කීපයකට පසුව විවිධ සංශෝධන සහිතව 2003 වසරේදී අධිකරණ අමාත්‍යංශය විසින් අවසන් කෙටුම්පත සකස් කරන ලද අතර එය 2004 පෙබරවාරි මාසයේ දී කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ඒ ආසන්න කාලයේදී පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද බැවින් එම පනත් කෙටුම්පත පිළිබඳව ආණ්ඩුවේ උනන්දුව ද මගහැරී ගියේය.

**නීති කොමිසමේ යෝජිත තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත-2006**

2006 වසරේ අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා නීති කොමිසම විසින් තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ යෝජිත පනත් කෙටුම්පතක් දෙවන වරටත් ඉදිරිපත් කරන ලදී. එකී පනත් කෙටුම්පත සමග ඉදිරිපත් කරන ලද වාර්තාවේ සඳහන් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය සඳහා ජනතා සහභාගීත්වය පරිපූර්ණ කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය නීති මගින් සම්මත කළ යුතු බවයි. එසේම 2003 වසරේදී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සම්මුති 2ක් වන සංවිධානාත්මක අපරාධ පිටුදැකීමේ සම්මුතිය හා එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අත්සන් කළ බැවින් යහපාලනය වර්ධනය කිරීම සඳහාද මෙවැනි පනතක අවශ්‍යතාවය දක්වා තිබිණි. එසේම මෑත කාලීන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු මගින් අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය ඇතුලත්වන බව ප්‍රකාශ කළ බැවින්ද එම ප්‍රතිපත්තිය සඳහා නීතිමය පිළිගැනීමක් අවශ්‍ය බවද දක්වා ඇත. එසේම එහි තවදුරටත් දැක්වෙන්නේ කොමිසම විසින් 2001 වසරේදී තොරතුරු නිදහස පිළිබඳ පනතක් ගෙන ඒමේ යෝජනාවක් අධිකරණ අමාත්‍යංශය වෙත යොමු කර ඇති බවයි.

එසේම මෙම පනත් කෙටුම්පත 2003 වසරේ අධිකරණ අමාත්‍යංශය විසින් සම්පාදනය කරන ලද පනත් කෙටුම්පතෙහි සංශෝධිත සංස්කරණයක් වන අතර එය මෑත කාලීන ජාත්‍යන්තර වෙනස්වීම්ද සැලකිල්ලට ගෙන වැඩිදියුණු කරන ලද බව සඳහන් විය[10].

**මිලින්ද මොරගොඩ මහතා ඉදිරිපත්කල පනත් කෙටුම්පත-2009**

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා විසින් පත් කරන ලද විශේෂඥ කමිටුවක් විසින් ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ හා කතෘ සංසදයේ ද අදහස් ලබාගෙන 2009 නොවැම්බර් මාසයේ දී තොරතුරු සඳහා ප්‍රවේශය පිළිබඳ පනත් කෙටුම්පතක් සකස් කරන ලදී . මෙම පනත්

---

[9] THE CASE FOR A FREEDOM OF INFORMATION ACT IN SRI LANKA by Rohan Edirisinghe

[10] Page-1 Draft Freedom of Information Bill(Proposed by Law Commission of Sri Lanka) April 2006

කෙටුම්පත 2004 වසරේදී කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත පදනම් කරගෙන එය වඩාත් සංවර්ධනය කරමින් සකස් කරන ලදී. මේ සදහා 2005 වසරේදී ඉංදියාව විසින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත ද ආදර්ශයට ගෙන ඇත [11]. මෙම කෙටුම්පත සකස් කිරීමේ කාර්යයේදී ඉහත සංවිධානවලට අමතරව තවත් සිවිල් සංවිධාන නියෝජිතයින් රැසකගේද සහය ලබාගන්නා ලදී. එය 2010 පාර්ලිමේන්තු මහ මැතිවරණය ආසන්න කාලයේදී අධිකරණ අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී. 2010 ජනාධිපතිවරණයෙන් මිළින්ද මොරගොඩ අමාත්‍යවරයා පරාජයට පත් වූ අතර එම පනත් කෙටුම්පත ඉදිරියට ගෙනයාමට කිසිවෙක් ඉදිරිපත් වූවේ නැත.

**විජේදාස රාජපක්ෂ මහතාගේ තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත-2010**

2010 වසරේදී එවකට විපක්ෂ මංත්‍රීවරයකු ලෙස කටයුතු කල විජේදාස රාජපක්ෂ මහතා විසින්ද තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පතක් සම්පාදනය කරන ලද බවට තොරතුරු තිබෙන නමුත් ඒ පිළිබඳ වැඩිදුර විස්තරයක් සොයාගත නොහැකි විය.

**කරූ ජයසූරිය මහතා ඉදිරිපත් කල පනත් කෙටුම්පත-2010**

2010 වසරේ සැප්තැම්බර් 23 දින විපක්ෂ මංත්‍රිවරයකු වන ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මංත්‍රි කරූ ජයසූරිය මැතිතුමන් තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව ඉදිරිපත් කරමින් එය සම්මත කල යුතු බවට යෝජනා කරන ලදී. විපක්ෂනායක රනිල් වික්‍රමසිංහ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. නමුත් ආණ්ඩු පක්ෂය විසින් එවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒමේ සූදානමක් ඇති බැවින් මෙම පනත් කෙටුම්පත ඉවත් කරගන්නා ලෙස ආණුඩු පක්ෂය විසින් දැඩි ලෙස ප්‍රකාශ කරන ලදී. එකී පනත් කෙටුම්පත සූදානම් බවත් මෙවැනි කරුණක් ප්‍රතිපත්තිමය කරුණක් බැවින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුත්තේ ආණ්ඩු පක්ෂය බවත් එබැවින් මෙම කෙටුම්පත ඉවත් කරගත යුතු බවත් ආණ්ඩු පක්ෂයේ සංවිධායක දිනේෂ් ගුණවර්ධන ඇතුළු ආණ්ඩු පක්ෂ මංත්‍රිවරුන් කිහිප දෙනෙක් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ආණ්ඩු පක්ෂයෙන් එම පනත ගෙන එන බවට පොරොන්දුවක් දීම මත කරූ ජයසූරිය මහතා සිය යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී[12].

**කරූ ජයසූරිය මහතා ඉදිරිපත් කල කෙටුම්පත-2011**

පසුව 2011 මැයි 13 වන දින ගැසට් පත්‍රයේ දෙවන කොටසේ පළකරන ලද මෙම පනත් කෙටුම්පත 2011 ජූනි මස 21 වන දින පෞද්ගලික මංත්‍රි යෝජනාවක් ලෙස කරූ ජයසූරිය මංත්‍රීතුමන් විසින් පාර්ලිමේන්තුවට ගෙන එන ලදී. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා එය ස්ථිර කරන කළේය. නමුත් මෙම පනත් කෙටුම්පත පිළිබඳව යෝජනාවට ආණ්ඩු පක්ෂය විරුද්ධත්වය ප්‍රකාශ කල බැවින් කථානායකවරයා විසින් ස්ථාවර නියෝග 43 යටතේ ඡන්දයක් විමසන ලදී. ඒ අනුව යෝජනාවට පක්ෂව ඡන්ද 32ක් ලැබුන අතර යෝජනාවට විපක්ෂව ඡන්ද 99ක් ලැබිණි.නොපැමිණි මංත්‍රීවරුන් 93කි[13]. ඒ අනුව එම පනත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳ විවාදය නොපැවිත්විනි.

---

[11] http://www.tisrilanka.org/?p=4659

[12] ජේද 559 2010 සැප්තැම්බර් 23 හැන්සාර්ඩ්

[13] ජේද 1527-2011 ජූනි 21 දින හැන්සාර්ඩ් වාර්තාව

**විපක්ෂයේ පොදු අපේක්ෂක මැතිවරණ ප්‍රකාශය-2015 ජනාධිපතිවරණය-**

පසුව 2015 ජනවාරි පැවති ජනාධිපතිවරණයේ විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සමග බෙදාහරින ලද "වෙනසකට එක්වෙමු මෛත්‍රී පාලනයක් දින 100කින් අලුත් රටක්" නැමති ප්‍රකාශනය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව පනතක් ගෙන ඒම ප්‍රමුඛ පොරොන්දුවක් විය. එකී ප්‍රකාශනයට අනුව 2015 පෙබරවාරි මස 20 වනදින මෙම කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මාර්තු 20 වන දින එය සම්මත කිරීමටත් නියමිත විය.

ඒ අනුව වර්ෂ 2015 මාර්තු 12 වන දින පැවති කැබිනට් රැස්වීමට ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතක් ගෙන ඒම සඳහා කැබිනට් පත්‍රිකාවක් ගෙන එන ලදී. ඒ අනුව මෙම පනත කෙටුම්පත් කිරීමේ වගකීම ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යංශය රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය හා අධිකරණ අමාත්‍යංශය වෙත පවරණ ලදී. මෙම කෙටුම්පත් කිරීම සඳහා ජනමාධ්‍යවේදීන් නීති ක්ෂෙත්‍රයේ ප්‍රවීනයන් රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් හා රාජ්‍ය නිලධාරීන්ගේ අදහස් සැලකිල්ලට ගත යුතු බවටද තීරණය විය.

ඒ අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මෙහෙයවීම මත පනත කෙටුම්පත් කිරීම සඳහා ජනමාධ්‍ය හා සිවිල් සංවිධාන නියෝජිතයිනගේ කමිටුවක් මගින් කෙටුම්පතක් සම්පාදනය කරන ලදී.

**තොරතුරු දැනගැනීමේ ප්‍රවේශය පිළිබඳ පනත් කෙටුම්පත 2015**

ඉන්පසුව 2015 අප්‍රේල් 22 වනදින කැබිනට් මණ්ඩලය වෙත අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් කැබිනට් පත්‍රිකාවක් ගෙන එමින් මෙම පනත හදිසි පනත් කෙටුම්පතක් ලෙස ගෙන ආයුතු බවට යෝජනා කරන ලදී[14]. එමෙන්ම එකී පනතේ මූලිකාංග පිළිබඳවද කැබිනට් මණ්ඩලයේ එකගතාවයක් ඇතිකරන්නා ලදී.

නමුත් 19 වන සංශෝධනය මගින් හදිසි පනත් ගෙන ඒමේ ක්‍රමවේදය අහෝසි කරන ලදී. 2015 අප්‍රේල් 29 වන දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීමේදී අග්‍රාමාත්‍යතුමා විසින් යෝජනාවක් ගෙන එමින් ඉහත කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද පනත් කෙටුම්පත සඳහා විවිධ ආයතන හා පුද්ගලයන් විසින් සංශෝධන ඉදිරිපත් කළ බැවින් එම කරුණුද සැලකිල්ලට ගෙන සංශෝධනය කළ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ අතර කැබිනට් මණ්ඩලය එය අනුමත කරන ලදී. එමෙන්ම පනත හදිසි පනත් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර සාමාන්‍ය ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් පාර්ලිමේන්තුවට ගෙන ඒමට එදින කැබිනට් මණ්ඩලය තීරණය කරන ලදී [15].

ඉන් පසුව 2015 නොවැම්බර් මස 02 දින කැබිනට් මණ්ඩලය වෙත අවසන් වශයෙන් සංශෝධනය කල කෙටුම්පත පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් ඉදිරිපත් කල විසින් තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලය විසින සම්මත කරන ලදී[16] . කැබිනට් මණ්ඩලය අනුමත කල පනත් කෙටුම්පත 2015 දෙසැම්බර් 18 වන දින ගැසට් පත්‍රයේ පල කරන ලදී .

---

[14] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=6047
[15] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=6062
[16] http://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=si&dID=6437

පසුව 2016 මාර්තු 8 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවට රජය විසින් ප්‍රචාරය කරන ලදී[17]නමුත් 2016 මාර්තු 8වන දින මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොවූ අතර, එදින පාර්ලිමේන්තුව ඇමතූ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ උතුරු පලාත් සභාවේ අනුමැතිය මේ වන තෙක් ලැබී නැති බැවින් එදින පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන බවත් එකී අනුමැති ලැබූ වහාම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බවයි[18].

අනතුරුව 2016 මාර්තු 24 වන දින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.[19]

මෙම පනත් කෙටුම්පතේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් පෙත්සම් 5ක් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුවූ අතර නීතිඥ සංගමය ඇතුලු සංවිධාන හා පුද්ගලයන් 5 දෙනෙකු මෙම පෙත්සම් සඳහා මැදිහත් වූ අතර එකී මැදිහත් වූ පාර්ශවකරුවන්ගේ ස්ථාවරය වූයේ පනත් කෙටුම්පත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූල බවයි. මෙම පෙත්සම් විභාගය 2016 අප්‍රේල් 5 හා 6 දෙදින තුල ගරු අගවිනිසුරුතුමන් හා තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා දෙදෙනෙකු ඉදිරියේදී පවත්වන ලදී.

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

[17] http://www.media.gov.lk/news-archives/485-rti-bill-in-parliament-on-march-8

[18] Page 15 –Hansard of 8th March 2016

[19] Page 856- Hansard 24th of March 2016